# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/12 - 2018 ජූලි මස 09 වැනි සඳුදා - 2018.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2017 අප්‍රේල් මස 19 වන දින අංක 2015/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) 2005 ජූනි මස 01 වන දින අංක 1395/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සහ ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවමින් ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''කළමනාකරණ පීඨය '' යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''2. රාජ්‍ය පරිපාලන අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ ෑ-

''3. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය''.

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

07 -793


1A - PG 4113 — 508 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*